රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
அரசாங்க தகவல் திணைக்களம்
Department of Government Information

## 2023-10-30 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹුණු තීරණ

### 01. නව සේවා නියුක්ති පනතක් සකස් කිරීම

කම්කරු හා විදේශ රැකියා ඇමතිතුමා විසින් වෘත්තීය සමිති, හාම්පුතුන් හා අදාළ පාර්ශ්වයන් සමඟ සාකච්ඡා කර වර්තමානයට ගැළපෙන ප්‍රතිපාදන සහිතව නව සේවා නියුක්ති පනතක් සකස් කිරීම සඳහා පිළියෙල කරන ලද සංකල්ප පත්‍රිකාව 2023-08-07 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී සාකච්ඡාවට ගන්නා ලදී. එකී සංකල්ප පත්‍රිකාව සම්බන්ධයෙන් තවදුරටත් අදාළ සියලු පාර්ශ්වයන් සමඟ සාකච්ඡා කර නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස අග්‍රාමාත්‍ය කාර්යාලය යටතේ ක්‍රියාත්මක වන ලේකම්, ලේකම් සහ රජය නියෝජනය වන ත්‍රෛපාර්ශ්වික කමිටුව වෙත යොමු කිරීමට එම අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කරන ලදී. ඒ අනුව, ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් රැස් වී ඇති එකී කමිටුව අදාළ සංකල්ප පත්‍රිකාව අධ්‍යයනය කර අවධානය යොමු විය යුතු කරුණු සම්බන්ධයෙන් නිර්දේශ සහිත වාර්තාවක් අමාත්‍ය මණ්ඩලයේ අවධානය පිණිස ඉදිරිපත් කරන ලදුව, එකී නිර්දේශ සහ කම්කරු හා විදේශ රැකියා ඇමතිතුමා විසින් මෙම කාරණාව අදාළව ඉදිරිපත් කරන ලද සංකල්ප පත්‍රිකාව පදනම් කර ගනිමින් පනත් කෙටුම්පතක් සකස් කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීමට තීරණය කරන ලදී.

### 02. උසස් අධ්‍යාපන සහයෝගීතාව සඳහා සහ චීන භාෂා මධ්‍යස්ථානය පිහිටුවීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් ගිවිසුම්වලට එළඹීම

ජාත්‍යන්තර සහයෝගීතාව, විද්වත් සහයෝගීතාව, සංස්කෘතික අන්තර්ක්‍රියා හා මිත්‍රත්වය ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගෙන උසස් අධ්‍යාපන සහයෝගීතාව සඳහා චීනයේ ෂැංහයි විවෘත විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුමකට එළඹීමටත්, එකී අවබෝධතා ගිවිසුමේ සහයෝගිතා ක්ෂේත්‍ර යටතේ චීන භාෂා මධ්‍යස්ථානයක් මෙරට ස්ථාපිත කිරීමට අදාළව ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය, ෂැංහයි විවෘත විශ්වවිද්‍යාලය සහ සීමාසහිත බැන්ක් ඔෆ් චයිනා අතර ත්‍රෛපාර්ශ්වීය ගිවිසුමකට අත්සන් තැබීමටත් අදාළ පාර්ශ්වයන් විසින් එකඟතාවට පැමිණ ඇත. ඒ අනුව, වසර පහක (05) කාලයක් සඳහා වලංගු වන පරිදි අදාළ ගිවිසුම්වලට එළඹීම පිණිස අධ්‍යාපන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.



163, කිරුළපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
163, கிருலப்பனை வொனியூ, கொழும்பு 05, இலங்கை.
163, Kirulapona Avenue, Colombo 05, Sri Lanka.
දු. தொ. T - (+94 11) 2515759
ෆැ. பெ. F - (+94 11) 2514753
ඊ மி. E - dg@dgi.gov.lk
www.dgi.gov.lk
www.news.lk

**03. සාක්ෂරතාව ඉහළ නැංවීම සඳහා Room to Read සංවිධානය හා අධ්‍යාපන අමාත්‍යාංශය අතර අත්සන් කරනු ලබන අවබෝධතා ගිවිසුම**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව, 'නූගත්කම සහමුලින්ම තුරන් කිරීම සහ සියලු තැනැත්තන්ට අධ්‍යාපනයේ සෑම අවස්ථාවකදීම සර්ව සාධාරණ හා සමාන ඉඩ ප්‍රස්තා ලබා ගැනීමේ අයිතිය සහතික කිරීමට' ශ්‍රී ලංකා රජය බැඳී සිටී. එකී කාර්යයේදී රජය විසින් සියලු පහසුකම් සැපයීම ප්‍රායෝගිකව අපහසු කාර්යයක් වන බැවින් වෙනත් පාර්ශ්වයන්ගේ ද සහාය ඒ සඳහා ලබා ගනු ලබයි. ඒ අනුව, 2005 වර්ෂයේ සිට අධ්‍යාපන අමාත්‍යාංශය විසින් Room to Read සංවිධානය හා එක්ව කියවීම වර්ධනය කිරීමේ වැඩසටහන සහ ගැහැනු ළමයින්ගේ අධ්‍යාපන වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබ ඇත. එම වැඩසටහන තවදුරටත් පුළුල් කර 2023-12-01 දින සිට වර්ෂ පහක (05) කාලයක් තුළ ක්‍රියාත්මක කිරීමට මේ වන විට සැලසුම් කර තිබෙන අතර ඒ සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය සහ Room to Read සංවිධානය අතර නව අවබෝධතා ගිවිසුමකට එළඹීම පිණිස අධ්‍යාපන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**04. සමථකරණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානය ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් වන ඒකාබද්ධ ප්‍රකාශය**

රාජ්‍යයන් සහ වාණිජ ආයතන අතර ඇති වන මතභේද විසඳීම සඳහා ගිවිසුම් පදනම් කරගත් සමථකරණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානයක් පිහිටුවීම පිණිස චීන රජය විසින් යෝජනාවක් ඉදිරිපත් කර ඇත. ඒ අනුව, චීන රජය විසින් උනන්දුවක් දක්වන රටවල් සමඟ සාකච්ඡා කර ඇති අතර එකී මූලික සාකච්ඡා කිහිපයකට ශ්‍රී ලංකාව ද සහභාගී වන ලදී. යෝජිත සංවිධානය ස්ථාපිත කිරීම සඳහා වන මූලික ඒකාබද්ධ ප්‍රකාශය 2022 ජූලි මාසයේදී නිකුත් කර ඇති අතර, එම ඒකාබද්ධ ප්‍රකාශය චීනය ඇතුළු රටවල් 10ක් පමණ අනුමත කරනු ලැබ ඇත. එකී ඒකාබද්ධ ප්‍රකාශය ශ්‍රී ලංකාව විසින් අනුමත කිරීම සම්බන්ධයෙන් අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය සහ නීතිපති දෙපාර්තමේන්තුව ඇතුළු අනෙකුත් රාජ්‍ය ආයතන වෙතින් අදහස් ලබාගෙන ඇති අතර, ඒකාබද්ධ ප්‍රකාශය අනුමත කිරීම මඟින් දැනට ශ්‍රී ලංකාව එළඹ ඇති ජාත්‍යන්තර වගකීම්වලට කිසිදු බලපෑමක් සිදු නොවන බව නිරීක්ෂණය වී ඇත. ඒ අනුව, සමථකරණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානය ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් වන ඒකාබද්ධ ප්‍රකාශය අනුමත කිරීම පිණිස විදේශ

කටයුතු අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව සඳහා අමාත්‍ය මණ්ඩලයේ එකඟතාව ලබා දීමට තීරණය කරන ලදී.

## 05. ශ්‍රී ලංකා අභිමන් - ජාතික කලා උළෙල

පොදු ජනතාවගේ රස වින්දනය හා විනෝදාස්වාදය වර්ධනය උදෙසා විවිධ සංස්කෘතික අංගයන් එක්තැන් කරමින් 2023 දෙසැම්බර් මස 30, 31 සහ 2024 ජනවාරි මස 01 යන දිනවලදී 'ශ්‍රී ලංකා අභිමන් - ජාතික කලා උළෙල' පැවැත්වීමට යෝජනා වී ඇත. ඒ අනුව, කොළඹ 07, ආනන්ද කුමාරස්වාමි මාවත සහ ඒ ආශ්‍රිතව පිහිටි නෙළුම් පොකුණ රඟහල, ජාතික කලාභවන, ජෝන් ද සිල්වා සමරු රඟහල, විහාරමහාදේවි උද්‍යානය, නව නගර ශාලාව සහ ජාතික කෞතුකාගාරය ආශ්‍රිත පරිශ්‍රයන් කේන්ද්‍ර කර යෝජිත කලා උළෙල පැවැත්වීමට සැලසුම් කර තිබේ. බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය හා ඊට අනුබද්ධ ආයතන සහ අනෙකුත් රාජ්‍ය හා පෞද්ගලික ආයතනවල ඒකාබද්ධ වැඩසටහනක් වශයෙන් 'ශ්‍රී ලංකා අභිමන් - ජාතික කලා උළෙල' පැවැත්වීම පිණිස බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 06. ශ්‍රී ලංකාවේ සමාජ ආරක්ෂණ ක්‍රම විධිමත් ආයතනික ව්‍යුහයක් යටතට පත් කිරීම

ශ්‍රී ලංකාවේ රැකියාවල නිරත මිලියන 8.1ක් පමණ වූ මුළු ශ්‍රමිකයන්ගෙන් මිලියන 1.2ක් පමණ රාජ්‍ය අංශයේ ද, මිලියන 3.4ක් පමණ පෞද්ගලික අංශයේ ද සේවාවන්හි නිරත වී සිටින අතර සමස්ත ශ්‍රමික සංඛ්‍යාවෙන් 58.4%ක් පමණ අවිධිමත් අංශයේ රැකියාවල නිරත වන බවට ජනලේඛන හා සංඛ්‍යාලේඛන වාර්තා අනුව පෙනී ගොස් ඇත. කෙසේ වුව ද, සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල වැනි සමාජ ආරක්ෂණ ක්‍රමවේද මඟින් ආවරණය වන්නේ ශ්‍රමිකයින් මිලියන 2.5ක් පමණ වූ අඩු ප්‍රමාණයකි. ඊට අමතරව, අවිධිමත් රැකියා අංශය සඳහා විවිධ රාජ්‍ය ආයතන මඟින් ගොවි රක්ෂණය, ධීවර රක්ෂණය වැනි විවිධ සමාජ ආරක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කරනු ලබන අතර, ඒ සඳහා වන වැය බර රජය විසින් දරනු ලබයි. සමාජ ආරක්ෂණ ක්‍රම විවිධ ආයතන මඟින් විවිධ ක්‍රමවේදයන් යටතේ ක්‍රියාත්මක කිරීමත්, ඒ සඳහා වන වැය බර රජය හෝ සේවා පක්ෂය විසින් දැරිය යුතු වීමත් හේතුවෙන් ඇති වන අපහසුතා නිසා මෙම සමාජ ආරක්ෂණ ක්‍රමයන්හි ඵලදායිතාව හා කාර්යක්ෂමතාව අභියෝගයට ලක්ව ඇති බැවින් දැනට ක්‍රියාත්මක සියලු සමාජ ආරක්ෂණ ක්‍රමවේද එක් ආයතනයක් යටතේ මෙහෙයවීමේ

යෝග්‍යතාව හඳුනාගනු ලැබ ඇත. කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමා විසින් ඒ සම්බන්ධයෙන් ඉදිරිපත් කළ යෝජනාව සැලකිල්ලට ගෙන, මෙම කරුණට අදාළ ජාත්‍යන්තර අත්දැකීම් ද අධ්‍යයනය කර දැනට ක්‍රියාත්මක සියලුම සමාජ ආරක්ෂණ ක්‍රමවේද එක් ආයතනයක් යටතේ ක්‍රියාත්මක කිරීමට හැකි වන අයුරින් ක්‍රමවේදයක් හඳුන්වා දීම පිණිස නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා අදාළ සියලුම පාර්ශ්වයන් නියෝජනය වන පරිදි කමිටුවක් පත් කිරීම පිණිස අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දීමට තීරණය කරන ලදී.

07. **1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නිකුත් කරන ලද රෙගුලාසි පාර්ලිමේන්තුවේ අනුමැතියට ඉදිරිපත් කිරීම**

1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ විධිවිධාන යටතේ පනවනු ලැබ ඇති සහ 2003-10-09 දිනැති අංක 2353/16 දරන අති විශෙෂ ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති 2023 අංක 14 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම පිණිස මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

08. **ශ්‍රී ලංකා ආර්ථික විද්‍යා හා ජාත්‍යන්තර වෙළෙඳ ආයතනය සම්බන්ධයෙන් වූ පනත් කෙටුම්පත**

ආර්ථික විද්‍යාව, ජාත්‍යන්තර මූල්‍ය සහ ජාත්‍යන්තර වෙළඳාමට අදාළ වන පර්යේෂණ සහ ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සඳහා අවකාශයක් වශයෙන් ක්‍රියාත්මක වීම, එකී ක්ෂේත්‍රවල අභිනව පර්යේෂණ සහ අධ්‍යයනයන් සිදු කිරීම, ආර්ථික, මූල්‍ය සහ වෙළෙඳ ප්‍රතිපත්ති ශක්තිමත් කිරීම සඳහා අදහස් ලබා දීමෙන් දායක වීම සහ ජාත්‍යන්තර හා කලාපීය වෙළෙඳ ප්‍රතිපත්ති ඒකාබද්ධතා ඵලදායිව ප්‍රවර්ධනය කිරීම යන අරමුණු සහිතව ශ්‍රී ලංකා ආර්ථික විද්‍යා හා ජාත්‍යන්තර වෙළෙඳ ආයතනය පිහිටුවීම සඳහා පනත් කෙටුම්පතක් සකස් කිරීම පිණිස අමාත්‍ය මණ්ඩලය විසින් මීට පෙර අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරනු ලැබ ඇති පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, ඉන් අනතුරුව අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

09. **2024-01-15 දින සිට 2024-06-14 දින දක්වා කාලය තුළ බොර තෙල් නැව් තොග 03ක් මිල දී ගැනීම සඳහා වන දිගුකාලීන කොන්ත්‍රාත්තුව**

2024-01-15 දින සිට 2024-06-14 දින දක්වා කාලය තුළ බොර තෙල් නැව් තොග 03ක් 100%ක් ගබඩාගත වැංකිවලින් නිකුත් කිරීමේ දී ගෙවීමේ ක්‍රමවේදය යටතේ මිල දී ගැනීම වෙනුවෙන් දිගුකාලීන කොන්ත්‍රාත්තුවක් පිරිනැමීම සඳහා ලංසු කැඳවා ඇති අතර ඒ සඳහා ලංසු 02ක් ලැබී ඇත. එකී ලංසු සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද විශේෂ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව විසින් ඉදිරිපත් කර ඇති නිර්දේශය මත පදනම්ව, අදාළ ප්‍රසම්පාදනය සිංගප්පූරුවේ M/s Vitol Asia Pte. Ltd. වෙත පිරිනැමීම පිණිස විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

10. **2024-01-15 දින සිට 2024-06-14 දින දක්වා කාලය තුළ බොර තෙල් නැව් තොග 03ක් දින 30කින් ගෙවීමේ පදනම මත ණයවර ලිපියක් මඟින් මිල දී ගැනීම සඳහා වූ දිගුකාලීන කොන්ත්‍රාත්තුව**

2024-01-15 දින සිට 2024-06-14 දින දක්වා කාලය තුළ බොර තෙල් නැව් තොග 03ක් දින 30කින් ගෙවීමේ පදනම මත ණයවර ලිපියක් මඟින් මිල දී ගැනීම සඳහා වූ දිගුකාලීන කොන්ත්‍රාත්තුව පිරිනැමීම පිණිස ලංසු කැඳවා ඇති අතර ඒ සඳහා ලංසු 03ක් ලැබී ඇත. එකී ලංසු සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද විශේෂ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව විසින් ඉදිරිපත් කර ඇති නිර්දේශය මත පදනම්ව, අදාළ ප්‍රසම්පාදනය M/s Coral Energy DMCC, UAE වෙත පිරිනැමීම පිණිස විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

11. **ශ්‍රී ලංකාවේ කඳුරට දෙමළ ජනතාව ශ්‍රී ලාංකික සමාජයට පූර්ණ වශයෙන් ඒකාබද්ධ කිරීම සඳහා වැඩසටහන් මාලාවක් පැවැත්වීම**

ශ්‍රී ලාංකික වැවිලි ප්‍රජාව සඳහා වසර 200ක් සැපිරීම සනිටුහන් කිරීමේ ජාතික වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට මෙන්ම එම ප්‍රජාවගේ අභිවෘද්ධිය සඳහා ඉදිරියේදී නවත් වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක කිරීමට රජය විසින් සැලසුම් කර ඇත. ඒ අනුව, ශ්‍රී ලාංකික පුරවැසියන් වන වතු ප්‍රජාවගේ අභිවෘද්ධිය සඳහා අධ්‍යාපන හා සෞඛ්‍ය පහසුකම් වැඩිදියුණු කිරීමට, ආර්ථික හා වෘත්තීයමය අවස්ථා ඇති කිරීමට සහ ස්ථිර පදිංචිය සහිත උසස් ජීවන තත්ත්වයක් ළඟා කර දීමට හැකි වන පරිදි ජලසම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය සහ

අනෙකුත් අදාළ රාජ්‍ය ආයතන හා රාජ්‍ය නොවන ආයතන සමඟ එක්ව අදාළ වැඩසටහන් ඵලදායීව හා කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම පිණිස අවශ්‍ය මඟ පෙන්වීම සහ අධීක්ෂණය කිරීම සඳහා ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් යුත් අමාත්‍ය මණ්ඩල අනුකමිටුවක් පත් කිරීම පිණිස ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 12. ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුවක් සකස් කර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම පිණිස අවශ්‍ය පියවර ගැනීම සඳහා ගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් අමාත්‍ය මණ්ඩල අනුකමිටුවක් සහ එම අනුකමිටුවට සහාය වීම පිණිස අග්‍රාමාත්‍ය ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් සහ සාමාජිකයින් 25 දෙනෙකුගෙන් සමන්විත විශේෂඥ කමිටුවක් පත් කරනු ලැබ ඇති අතර, එම විශේෂඥ කමිටුව විසින් අදාළ විශේෂිත ක්ෂේත්‍ර සහ විෂයගත කරුණු පිළිබඳව අවධානය යොමු කරමින් ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව කෙටුම්පත් කර තිබේ. එකී කෙටුම්පත සඳහා අමාත්‍ය මණ්ඩල අනුකමිටුව විසින් ඉදිරිපත් කරන ලද නිරීක්ෂණ සහ නිර්දේශ ඇතුළත් කරමින් තවදුරටත් වැඩිදියුණු කර "ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව - 2023-2033" සකස් කර ඇත. එකී ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව පාර්ලිමේන්තුවේ අධ්‍යාපනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කිරීමටත්, ඉන් අනතුරුව අනුමැතිය පිණිස පාර්ලිමේන්තුවේ සභාගත කිරීමටත් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 13. ආදායම පදනම් කරගත් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව ශක්තිමත් කිරීම සඳහා වන බදු ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ

ණය තිරසරභාවය තහවුරු කර ගැනීමේ අරමුණින් ආදායම මත පදනම් වූ රාජ්‍ය මූල්‍ය ස්ථාවරත්වය සඳහා 2022 ජූනි මාසයේ සිට බදු පදනම වැඩි වන සහ වර්ධනාත්මක බදු ප්‍රතිපත්ති යෝජනා ගණනාවක් ක්‍රියාත්මක කරනු ලැබ ඇති අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේ මුල් මාස 09 තුළ රජයේ බදු ආදායම 51%කින් ඉහළ ගොස් තිබේ. එසේ වුවද ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ එකඟ වී ඇති බදු එකතු කිරීමේ ඉලක්ක සපුරා ගැනීමට මෙතෙක් හැකි වී නොමැත. ඒ අනුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ එකඟ වී ඇති පරිදි බදු ආදායම් සහ ප්‍රාථමික ශේෂ ඉලක්කයන් සපුරා ගැනීමට හැකි වනු පිණිස දැනට ක්‍රියාත්මකව පවතින එකතු කළ අගය මත වන බදු අනුපාතිකය 2024-01-01 දින සිට ක්‍රියාත්මක වන පරිදි 18% දක්වා වැඩි

කිරීමටත්, දැනට එකතු කළ අගය මත වන බද්ද අදාළ නොවන ඇතැම් භාණ්ඩ හා සේවා මත එකී බද්ද පැනවීම ඇතුළු නව බදු යෝජනා කිහිපයක් 2024-01-01 දින සිට ක්‍රියාත්මක කිරීමටත් අදාළ නීති සංශෝධනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දෙන ලදී.

14. **විදුලිබලය සැපයීම සම්බන්ධයෙන් දැනට පවතින පොදු ප්‍රතිපත්ති මාර්ගෝපදේශ සංශෝධනය කිරීම**

2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ විධිවිධාන අනුව අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියට යටත්ව විදුලිබලය සැපයීම සම්බන්ධයෙන් වන පොදු ප්‍රතිපත්ති මාර්ගෝපදේශයන් සකස් කිරීම සඳහා විදුලිබල විෂයභාර අමාත්‍යවරයා වෙත බලය පැවරී ඇත. ඒ අනුව, දැනට පවතින පොදු ප්‍රතිපත්ති මාර්ගෝපදේශ අනුව විදුලි ගාස්තු සමාලෝචන කාලය මාස හයක් (06) වශයෙන් තීරණය කරනු ලැබ තිබේ. එහෙත්, ඒ අනුව කටයුතු කිරීම හේතුවෙන් පොදු මහජනතාවට මුහුණ පෑමට සිදු වන අපහසුතා සැලකිල්ලට ගෙන අදාළ කාලසීමාව මාස තුනක් (03) වශයෙන් සංශෝධනය කිරීමටත්, ලංකා විදුලිබල මණ්ඩලයේ බලශක්ති යැවුම් විගණන (Dispatch Audit) ක්‍රියාත්මක කිරීමට සහ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව ජල විදුලි පුරෝකථන ශක්තිමත් කිරීමටත් හැකි වන පරිදි දැනට ක්‍රියාත්මක පොදු ප්‍රතිපත්ති මාර්ගෝපදේශ සංශෝධනය කිරීම පිණිස මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා සහ විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා ඉදිරිපත් කළ ඒකාබද්ධ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

15. **2024 වර්ෂය සඳහා වන අයවැය මඟින් සිදු කිරීමට අපේක්ෂිත වැටුප් සංශෝධන**

2024 වර්ෂයේ අයවැය මඟින් රාජ්‍ය සේවයේ සහ පෞද්ගලික අංශයේ වැටුප් වැඩි කිරීම සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය විසින් සාකච්ඡා කරන ලදී. ඒ පිළිබඳව පැවති සාකච්ඡාවේදී ඉදිරි අයවැය මඟින් රාජ්‍ය සේවක වැටුප් හා පෞද්ගලික අංශයේ වැටුප් සංශෝධනය කිරීම සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා වශයෙන් පාර්ලිමේන්තුව වෙත යෝජනා ඉදිරිපත් කිරීමට තමා අපේක්ෂා කරන බව ගරු ජනාධිපතිතුමා විසින් අමාත්‍ය මණ්ඩලය දැනුම්වත් කරන ලදී.

**************